# අපේ රටේ
# පලතුරුවල රස වෑහේ

බප/කො/මහින්ද විද්‍යාලය,
කොළඹ 10
2019

- **පර්යේෂණ මාතෘකාව :**

## අපේ රටේ පලතුරුවල රස වෑහේ

- **හැඳින්වීම :**

සිසුන් උගත් විෂයය කරුණු නිර්මාණාත්මකව ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දීම සඳහා මෙම පර්යේෂණ වැඩසටහන මම සැලසුම් කළෙමි.මෙහි දී නියැදිය වශයෙන් යොදා ගන්නේ 2 ශ්‍රේණියේ ඉගෙනුම ලබන ශිෂ්‍යයින් තිස් දෙනෙකි.

පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයයේ "අප කන බොන දේ" යන තේමාවේ කුඩා කොටසක් මේ සඳහා යොදා ගන්නා ලදී. දේශීය පලතුරු වර්ග පිළිබඳව ශිෂ්‍යයින් දැනුවත් කිරීමත් ඒ ඇසුරින් සකස් කළ ක්‍රියාකාරකම්වල සිසුන් නිරත කර ඔවුන්ගේ කුසලතා නිර්මාණශීලීව ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දීමත් මෙහි

- අරමුණු :

  ❖ දේශීය පලතුරු වර්ග නම් කරයි.
  ❖ විවිධ පලතුරු වර්ගවල රසය පිළිබඳ අදහස් දැක්වීමට කැමැත්ත පළ කරයි.
  ❖ දේශීය පලතුරු වර්ග පිළිබඳ අභිමානයෙන් කතා කරයි.
  ❖ තනි තනිව කළ නිර්මාණයන් පිළිබඳව අදහස් ප්‍රකාශ කරයි.
  ❖ කණ්ඩායම් වශයෙන් එක් වී සාමූහිකව රංගනයේ යෙදෙයි.

- දත්ත එක් රැස් කිරීම :

  - නිරීක්ෂණ ක්‍රමය
  - සාකච්ඡා ක්‍රමය
  - සම්පූර්ණ කරන ලද නිර්මාණවල ලේඛන අධ්‍යයනය

# පර්යේෂණ පියවර

පියවර 1

දේශීය පලතුරු වර්ග 5ක් පිළිබඳව සිසුන් දැනුවත් කිරීම.(presentation)

පියවර 2

එම පලතුරු වර්ග සජීවීව දැකීමට හා ස්පර්ශයට අවස්ථාව සලසා දීම.

පියවර 3

එක් එක් පලතුර රස විදීමට අවස්ථාව සලසා දීම. තමන් වඩාත් කැමති පලතුර ඉදිරියෙන් හරි ලකුණ පහත සටහනේ ලකුණු කිරීමට යොමු කිරීම.

| ශිෂ්‍යයාගේ නම | වරකා | අඹ | අන්නාසි | ගඩුගුඩා | කොමඩු | පේර |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

**ක්‍රියාකාරකම 1 :**

දේශීය පලතුරු වර්ග හඳුනා ගනිමු

- සිසුන් කණ්ඩායම් 6කට වෙන් කිරීම.
- දේශීය හා විදේශීය පලතුරු වර්ගවල රූප ඇතුළත් පෙට්ටියක් සෑම කණ්ඩායමක් ඉදිරියෙන් තැබීම.
- එම පෙට්ටියෙන් දේශීය පලතුරු වර්ග තෝරාගෙන $A_3$ කොළයක ඇලවීමට අවස්ථාව ලබා දීම.

- **ක්‍රියාකාරකම 2 :**

රංගනයේ යෙදෙමු සතුටු වෙමු

- රංගනයේ යෙදීමට අවශ්‍ය ද්‍රව්‍ය වේදිකාවේ එක් පසකින් තැබීම.

  උදා: ඇඳුම්

  පලතුරු වලින් සෑදු ඔටුනු

  පලතුරු කඩයක අනුරුවක්

  දේශීය පලතුරු වර්ගවල රූප

- සිසුන් රංගනය ඉදිරිපත් කරන ආකාරය පිළිබඳව දැනුවත් කිරීම.
- ඉහත ද්‍රව්‍යය උපයෝගී කර ගනිමින් එක් එක් කණ්ඩායම ඉදිරියට පැමිණි රංගනය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම.
- ඒ සඳහා පහත සඳහන් මාතෘකාවලින් කැමති මාතෘකවක් තෝරා ගැනීමට යොමු කිරීම.

  උදා: පලතුරු කඩයක්

  පලතුරු රූප ඇඳගෙන පලතුරු ගැන හඳුන්වා දීම.

  පලතුරු සලාදයක්/පලතුරු බීමක් සෑදීම.

**ක්‍රියාකාරකම 3 :**

පලතුරු කැබලි ගෙන සත්ත්ව රූප නිර්මාණය කරමු

- පලතුරු කැබලි යොදා ගෙන නිර්මාණයන් කරන ආකාරය පෙන්වීම.
- පලතුරු කැබලි බඳුන්වලට දමා එක් එක් කණ්ඩායම්වලට ලබා දීම.
- කඩදාසි පිඟන් ලබා දීම.
- කූඩා ඉරටු කැබලි ලබා දීම.
- මේ ද්‍රව්‍ය යොදා ගෙන කැමති නිර්මාණයක් කරන ලෙස පැවසීම.

## ඇගයීම

- සිසුන්ගේ චර්යා නිරීක්ෂණය කිරීම.
- කරන ලද නිර්මාණයන් සඳහා වර්ණ තුනකින් තරු ලකුණු ලබා දීම.

| | | |
|---|---|---|
| රතු | - | ඉතා හොඳයි |
| කහ | - | හොඳයි |
| කොළ | - | ටිකක් හොඳයි |

වශයෙනි.

- අසන ප්‍රශ්නවලට සිසුන් පිළිතුරු ලබා දෙන දීම.